www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පුළුල්ව පැතිරුනු ගුරු වර්ජනයෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ සමිති නායකයෝ යටත් වීමට සූදානම් වෙති

## Sri Lankan unions prepare to cave in following widespread teachers’ strike

**අපගේ වාර්තාකරුවන් විසිනි**
**2007 සැප්තැම්බර් 21**

සැප්තැම්බර් 13 දා පැවති රාජ්‍ය අංශයේ ගුරුවරුන්ගේ එක් දින වර්ජනයට ශ්‍රී ලංකාවේ ආන්ඩුව ප්‍රතික්‍රියා කර ඇත්තේ වර්ජකයන් බියගැන්වීමට පොලීසිය යෙදවීම සහ අදාල ගුරු සමිතිවලට දඬුවම් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරනයේ නඩුවක් ගොනු කිරීම මගිනි. සමිති පහ මෙයට ප්‍රතිචාර දැක්වූයේ කිසිදු වැටුප් වැඩිවීමක් දිනා ගැනීමෙන් තොරව තව දුර උද්ඝෝෂනය මුලුමනින් ම පාහේ නතර කිරීමෙනි.

ප්‍රධාන නාගරික මධ්‍යස්ථානවල සිට හුදකලා ග්‍රාමීය ප්‍රදේශ හා වතුකරයේ දිස්ත්‍රික්ක දක්වා, සමස්ත ගුරු කාර්ය මන්ඩලයෙන් සියයට 90ක් පමන සම්බන්ධ වූයේ යැයි තක්සේරු කෙරෙන මෙම වර්ජනය රටේ ඉතිහාසය තුල පැවති වඩාත්ම පුළුල්ව පැතිරුනු ගුරු වර්ජනය විය. කලින් ගුරුවරුන් අතලොස්සක් පමනක් වර්ජන ක්‍රියාමාර්ගවලට සම්බන්ධ වී තිබූ රාජකීය විදුහල හා ආනන්ද විද්‍යාලය වැනි ඉහල පෙලේ පාසල්වල පවා කටයුතු මුලුමනින් ම ඇනහිටුනි.

දිවයිනේ 240,000ක් වන ගුරුවරුන්ගෙන් බොහෝ දෙනෙක් වර්ජනයට සහයෝගය දැක්වූයේ ඔවුන්ගෙන් හතරෙන් පංගුවක් පමනක් සමිති සාමාජිකයන් වීම නොතකා ය. ආන්ඩුව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව යුද්ධය උත්සන්න කිරීම නිසා වැඩි දියුනු කෙරුනු නැගෙන උද්ධමනය මගින් පහර කෑමට ලක්ව ඇති ගුරුවරු තුල තතක් හැඬවීමට මෙම උද්ඝෝෂනය සමත් විය. සමිති ඉල්ලා සිටින්නේ 1997 තරම් ඈතට දිවෙන වැටුප් විෂමතාවක් ඉවත් කරන ලෙස යි. එමගින් ඔවුන්ගේ මාසික වැටුප් රුපියල් 5,000කින් පමන ඉහල නගිනු ඇත.

වර්ජනයේ බලපෑමට බොහෝ සෙයින් ලක් නොවූ ප්‍රදේශ වූයේ දිවයිනේ උතුරේ හා නැගෙනහිර යුද කලාපයන් ය. එම ප්‍රදේශවල දී එල්ටීටීඊය තථ්‍ය වසයෙන් වර්ජනයට විරුද්ධව ආන්ඩුව හා එක පෙලට සිටගත්තේ ය. වර්ජනයට දිනකට පෙර, දෙමල ගුරු සංගමයේ (දෙගුස) හිටපු සභාපති ටී. මහසිවම්, යාපනයේ දෙමල භාෂාවෙන් පල වන එල්ටිටීඊ-හිතැති උදයන් පත්‍රයට කියා සිටියේ දැනටමත් යුද්ධයේ බලපෑමට ලක්ව ඇති දෙමල සිසුන්ට අවාසියක් සිදු නොවනු පිනිස දෙගුස විරෝධතා ව්‍යාපාරයට එක් නොවන බව යි. මෙම වර්ගෝත්තමවාදී ආයාචනය, සිසුන්ගේ අධ්‍යාපනයට හානි කිරීම සම්බන්ධයෙන් ගුරුවරුන්ව හෙලා දැකි ඇති කොලඹ සංස්ථාපිත මාධ්‍යවල ආස්ථානය සමග මුලුමනින් ම පාහේ අනන්‍ය වේ.

වර්ජනයට පැවති පුළුල් සහභෝගය නොතකා. සමිති එහි බලපෑම අවම කිරීමට හැකි සෑම දෙයක් ම කලහ. කිසිදු විරෝධතා රැලියක්, පෙලපාලියක් හෝ මහජන රැස්වීමක් නොපැවැත්වුනි. සමිති නායකයන් සිය සාමාජිකයන්ට පැවසුවේ නිකම්ම සිය නිවෙස්වල රැඳී සිටින ලෙස යි. වෙනත් වචනවලින් කිය තොත්. ගුරුවරුන් අතර වැඩෙන අසන්තෘප්තිය හේතු කොට ගෙන වර්ජනය කැඳවීමට ඔවුන්ට බල කෙරුනු නමුත් ආන්ඩුව සමග ගැටුමක් වලකා ගැනීමෙහිලා සමිති මංමුලා සහගත ප්‍රයත්නයක යෙදුනහ. මොන යම් හෝ බැරෑරුම් අරගලයක් නොවැලැක්විය හැකි ලෙස ම මතු කරනු ඇත්තේ මිලිටරි වියදම් දැවැන්ත ලෙස ඉහල දැමීමට ද යුද්ධයට ද විරුද්ධ වීමේ ප්‍රශ්නය යි. සමිති නායකයෝ ඒ හෝ මේ ආකාරයෙන් යුද්ධයට එකඟ ය.

වර්ජනයට පෙර පැවති සාකච්ඡාවල දී ජනාධිපති මහින්ද රාජපක්ෂ සමිති නායකයන්ට විවෘතව ම අභියෝග කරමින් කියා සිටියේ වැටුප් වැඩිකිරීම සඳහා ආන්ඩුවට මුදල් නැති බව යි. “ඔබලා කියන්නේ අප උතුරෙන් හා නැගෙනහිරෙන් හමුදා ඉවත් කර ගත යුතු බව ද?” යැයි ඔහු ඔවුන්ගෙන් විමසී ය. එහි සිටි එකදු සමිති නායකයෙක් වත් යුද්ධයට විරුද්ධ නොවී ය. “සටන්කාමී * ලංකා ගුරු සේවා සංගමය අනුබද්ධව සිටින්නේ, ආන්ඩුවේ ප්‍රතිගාමී යුද්ධයට සහාය දෙනවා පමනක් නොව එය උත්සන්න කල යුතු යැයි ඉල්ලා සිටින ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සමග ය.

දේශපාලන අරගලයක් ගෙන යාම හා සෙසු කම්කරුවන්ට ආයාචනා කිරීම ප්‍රතික්ෂේප කිරීම මගින් සමිති රාජපක්ෂට ආරම්භකත්වය භාර දුන්හ. ආන්ඩුව, විරුද්ධත්වය මතු වීම වලකා ගැනීමට මංමුලා සහගතව, ගුරුවරුන්ට හිරිහැර කිරීම හා ඔවුන් බියගැන්වීම පිනිස පොලීසිය හා උසාවිය යොදා ගැනීමට පැකිලුනේ නැත. විරෝධතාවට සහභාගි නොවන ලෙස ඔවුන්ට බල කරනු පිනිස සැප්තැම්බර් 13 දා පොලීසිය ගුරුවරුන්ගේ නිවාසවලට ගිය අවස්ථා ගනනාවක් වාර්තා විය.

එදින ම, වර්ජනයට සම්බන්ධිත විරෝධතා ව්‍යාපාරයක් මගින් පැන නගින චෝදනාවලට පිලිතුරු දෙනු පිනිස සමිති නායකයෝ ශ්‍රේෂ්ඨාධිකරනය වෙත ගෙන එන ලදි. මේ වසරේ අ.පො.ස. (උසස් පෙල) විභාගයේ පිලිතුරු පත්‍ර පරීක්ෂාවෙහි නිරත වුනු ගුරුවරුන්ගේ වර්ජනයක් සමිති විසින් කලින් කැඳවුම් කර තිබුනි. එය වනාහි මොන යම් හෝ වර්ජන ක්‍රියාවක් කල් දමමින් ආන්ඩුවට බලපෑම් දැමීම ඉලක්ක කර ගත් සීමිත විරෝධතා ව්‍යාපාරයකි. පිලිතුරු පත්‍ර පරීක්ෂාවේ යෙදෙන්නේ 1,000කටත් වඩා අඩු ගුරුවරුන් සංඛ්‍යාවකි.

එයට ප්‍රතිචාර වසයෙන් ආන්ඩුව ශ්‍රේෂ්ඨාධිකරනයට ගිය අතර විභාග පිලිතුරු පත්‍ර පරීක්ෂාවට බාධා නොකල යුතු යැයි සැප්තැම්බර් 6 දා එය නියෝගයක් නිකුත් කලේ ය. සැප්තැම්බර් 13 වර්ජනය, විභාග දෙපාර්තමේන්තුව පිලිතුරු පත්‍ර පරීක්ෂාව යලි ඇරඹීම නිවේදනය කල දිනය සමග සම්පාත විය. විභාග කොමසාරිස් අනුර එදිරිසිංහ, ගුරු සමිති පහේ නායකයන්ව වහාම උසාවියට රැගෙන ගියේ ඔවුන් පෙර නිකුත් කෙරුනු ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුව උල්ලංඝනය කරන බව කියාපාමිනි.

අග විනිසුරු සරත් එන්. සිල්වා සහ තවත් විනිසුරුවරු තිදෙනෙක් පසු ගිය සිකුරාදා එම නඩුව විභාගයට ගත්තේ ය. සිය වර්ජනය ආරක්ෂා කරනු වෙනුවට සමිති වහාම යටත් විය. තමන් උසාවි නියෝගය නොතකා සිටීම හා උසාවියට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු නොකිරීමට නිදහසට කරුනු විමසූ කල, සිය නීතිඥයන් හරහා සමිති නායකයන් කියාපෑමට තැත් කලේ තමන් උසාවි නියෝගය දැන නොදැන සිටි බව යි. උසාවි නියෝගය මාධ්‍ය මගින් ප්‍රසිද්ධියට පත් කෙරී ඇති බව පෙන්වා දෙමින් සිල්වා එම දුබල නිදහසට කාරනාව ප්‍රතික්ෂේප කලේ ය.

දැන් නොවැම්බර් 19 දා සමිති නායකයන් උසාවියට අපහාස කිරීම සම්බන්ධයෙන් නඩු විභාගයට ලක් කෙරුනු ඇති අතර වරදකරුවන් වුව හොත් බන්ධනාගාර ගත කෙරෙනු ඇත. රුපියල් 50,000 බැගින් ඔවුන්ට ඇප නියම කෙරුනි. සිය නියෝගය මගින් අග විනිසුරු සිල්වා තව දුරටත් මෙසේ ප්‍රකාශ කර සිටියේ යඃ "ඇප කාල පරිච්ඡේදය තුල දී අදාල පුද්ගලයන් පිලිතුරු පත්‍ර පරීක්ෂාවට බාධා නොකල යුතු ය. ඔවුන් එම වරද කල හොත් ඔවුන්ට ඒ සම්බන්ධයෙන් තව දුරටත් වග උත්තර බැඳීමට සිදු වනු ඇත."

ආන්ඩුවට හා උසාවියට අභියෝග කරනවා වෙනුවට, සමිති වහාම යටත් විය. සැප්තැම්බර් 15 දා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී සමිති මෙසේ නිවේදනය කලේ යඃ "රටේ නීතියට කීකරු වීමට අපට සිදුව ඇත. එබැවින් අපි ශ්‍රේෂ්ඨාධිකරනයේ තීන්දුවට හිසා නමා පිලිතුරු පත්‍ර පරීක්ෂාව අවසන් වන තෙක් අපගේ ක්‍රියා මාර්ග නතර කරන්නෙමු. ඉන් පසුව අපි අපගේ ක්‍රියා මාර්ග යලි ආරම්භ කරන්නෙමු."

සමිති නායකයන්ගේ ක්‍රියාවන් ඔවුන් උද්ඝෝෂනය අකුලා ගැනීමට සූදානම් වන බවට නිසැක සලකුනකි. එපමනක් නොව, සියලු විරෝධතා නතර කිරීම මගින් සමිති තනි තනි ගුරුවරුන් දඩයම් කිරීම සඳහා මාවත විවෘත කර තිබේ. වර්ජන දිනයේ දී ම *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* වාර්තා වූයේ පොලීසිය විභාග පිලිතුරු පත්‍ර පරීක්ෂා කරන මධ්‍යස්ථානවලට පැමිනි ගුරුවරුන්ගේ විස්තර රැගෙන ගිය බව යි. පිලිතුරු පත්‍ර පරීක්ෂාව යලි ඇරඹීමට අපොහොසත්ව ඇති විදුහල්පතිවරු 15කගේ හා ගුරුවරු 270කගේ ලැයිස්තුවක් තමන් සකසා ගෙන ඇති බවත් ඔවුන් උසාවියට රැගෙන ඒම තම අභිප්‍රාය බවත් විභාග කොමසාරික් එදිරිසිංහ පසුගිය සති අන්තයේ දී මාධ්‍යවලට පැවසී ය.

කොලඹ මාධ්‍ය ගුරුවරුන්ට එරෙහිව දුෂ්ට උද්ඝෝෂනයක් ගෙන යයි. නිදසුනක් ලෙස, දක්ෂිනාංශික *අයිලන්ඩ්* පත්‍රයේ සඳුදා පල වූ කතුවැකියක් ගුරුවරුන් "වල් තිරිසනුන්ට" සමාන කලේ ය. එය තව දුරටත් මෙසේ සඳහන් කලේ යඃ "දරුවන් වියදමින් ගෙන ගිය ඔවුන්ගේ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය සමාන වන්නේ පවුල් ආරවුලක් උඩ සිය අඬන ලදරුවාට මව්කිරි දීම ප්‍රතික්ෂේප කරන මවකට ය."

ඇත්ත වසයෙන් ම, ආන්ඩුව ශිෂ්‍යයන්ට හා ගුරුවරුන්ට එක සේ පහර ගසමින් මහජන අධ්‍යාපනයට වෙන් කෙරෙන මුදල් කප්පාදු කිරීම ගැන පැවසීමට මෙම පුවත් පත්වලට කිසිවක් ඇත්තේ නැත. පාසල් ලමුන් මත පමනක් නොව ජනගහනයෙන් බහුතරයකගේ සුභසාධන. සෞඛ්‍ය සේවා සහ ජීවන මට්ටම් මත රාජපක්ෂගේ යලි ඇරඹූ යුද්ධය මගින් ඇති කෙරුනු ව්‍යසනකාරී බලපෑම ගැන පවතින්නේ මුලුමනින් ම නිල නිහඬතාවකි.

සමිති ආන්ඩුවට යටත් වීමට සූදානම් වන කල මේවා ගැන කීමට ඔවුන්ට ද කිසිවක් නොමැති වීම අර්ථභාරී ය. සමාජවාදී සමානතා පක්ෂය (සසප) සිය ප්‍රකාශය තුල අනතුරු ඇඟවූ පරිදිඃ "කම්කරුවන් උගත යුතු වන මූලික දේශපාලන පාඩම නම් යුද්ධයට එරෙහිවන්නා වූ සමාජවාදී ක්‍රියාමාර්ගයක් නැතිව වැටුප්, සේවා තත්වයන් හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කරගත නොහැකි බව ය."

© www.wsws.org